# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,305 - 2022 නොවැම්බර් මස 04 වැනි සිකුරාදා - 2022.11.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 234 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 237 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 නොවැම්බර් මස 25වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

233- B 082397- 353 (2022/11)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිතාරා රුවිනි ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985.01.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/2065 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන කඩවල පදිංචි දන්ත ගෙදර විදානෙලාගේ පීරිස් සිංඤෝ මහතා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 1/259 යටතේ 1986.09.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගමුව පත්තුවේ/කෝරළේ කඩවල (අඹගමුව නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කඩවල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, අංක පි පි. මහ 293 දරන පිඹුරේ අංක 33 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයේ රූඩ් 01, පර්. 31 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : වේවැල්තලාව.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පි. පි. මහ 293 පිඹුරෙහි කට්ටි අංක 31, |
| *නැගෙනහිරට* | : | පි. පි. මහ 293 පිඹුරෙහි කට්ටි අංක 32, |
| *දකුණට* | : | පි. පි. මහ 293 පිඹුරෙහි කට්ටි අංක 34, |
| *බස්නාහිරට* | : | පි. පි. මහ 293 පිඹුරෙහි කට්ටි අංක 35. |

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2022 අගෝස්තු මස 24 වැනි දින.

11-60/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිතාරා රුවිනි ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.03.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/5395 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන අප්කට් පදිංචි මරක්කල මානගේ විමලදාස මහතා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 03/252 යටතේ 1990.08.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව පත්තුවේ/කෝරළේ මස්කෙළිය (ස්ත්‍රැස්පි) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අප්කට් නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, අංක පි පි. නු. 1115 දරන පිඹුරේ අංක 16 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.103ක් විශාත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : ගවරවිල II.

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. නු. 1115 පිඹුරේ කැබලි අංක 08 සහ ගවරවිල වත්ත, |
| *නැගෙනහිරට* | : ගවරවිල වත්ත, |
| *දකුණට* | : පි. පි. නු. 1115 පිඹුරේ කැබලි අංක 18 සහ 15, |
| *බස්නාහිරට* | : පි. පි. නු. 1115 පිඹුරේ කැබලි අංක 15 සහ 8. |

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2022 මාර්තු මස 24 වැනි දින.

11-60/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඕ. එස්. පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.10.05 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/තිස්/3/ප්‍ර/ගො/53 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන තිස්පනේ අංක 3 හි පදිංචි දිසානායක මුදියන්සේලාගේ ඩිංගිරි මැණිකේ වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො 156/1286/2000 යටතේ 2000.11.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ, කටුගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තිස්පනේ උඩගම්මැද්ද නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය මැණුම් අධිකාරි භාරයේ ඇති මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක නු. 1350 දරන කට්ටි කැබීමේ පිඹුරේ 39 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.095 (බිංදුවයි දශම බිංදුවයි නවයයි පහක්) විශාලත්වය අත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - තිස්පනේ වත්ත.

*උතුරට* : කැබලි අංක 40, 41 සහ 42,
*නැගෙනහිරට* : කැබලි අංක 42 සහ 43,
*දකුණට* : කැබලි අංක 44 සහ 38,
*බස්නාහිරට* : කැබලි අංක 38 සහ 37.

ඕ.එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උපකාර්යාලය.

2022 මැයි මස 23 වැනි දින.

11-60/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 අප්‍රේල් මස 28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/497 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන මීහිඳුපුර පදිංචි මර්ලියා උම්මා මහත්මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/12/263/95 යටතේ 1995.09.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔය පළාත පත්තුවේ/කෝරළේ මීහිඳුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සීතාඑළිය නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, - අංක අ. අ. 4 අ. කැ. මැ. මු. පි. 53 බී දරන කට්ටි කැබීමේ පිඹුරේ 264 අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.054 පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 263 හා 168,
*නැගෙනහිරට* : කැබලි අංක 266,
*දකුණට* : කැබලි අංක 265,
*බස්නාහිරට* : කැබලි අංක 265 සහ 263.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2021 නොවැම්බර් මස 15 වැනි දින.

11-60/4

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 මාර්තු මස 25 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/127 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන ශාන්තිපුර, නුවරඑළිය පදිංචි ගමගේ ලිසි ප්‍රනාන්දු මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/01/74 අංකය යටතේ 1982.04.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර කෝරළේ 535 එම් ශාන්තිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ශාන්තිපුර *නොහොත්* කිකිලියාමාන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය මැණුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එම් 6/42 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පි. පි. ඒ. 3140 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 38 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 10 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : පි. පි. ඒ. 3140 හි කැබලි අංක 36 සහ 37,
*නැගෙනහිරට* : ඇළ රක්ෂිතය,
*දකුණට* : පි. පි. ඒ. 3140 හි කැබලි අංක 54,
*බස්නාහිරට* : ඇළ රක්ෂිතය.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2022 මාර්තු මස 28 වැනි දින.

11-60/5

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.14 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1455 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන පට්ටිපොල පදිංචි අගලවත්ත රෝහණ අජිත් ජයන්ත සිල්වා මහතා වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/43/2465/96 අංකය යටතේ 1996.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ පට්ටිපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පට්ටිපොල නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක ක. කැ. මු. පි. 54 ඩී අංක දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 27 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : රජයේ කැලෑව,
*නැගෙනහිරට* : කැබලි අංක 28,
*දකුණට* : කැබලි අංක 22 සහ 23,
*බස්නාහිරට* : කැබලි අංක 26.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2022 අප්‍රේල් මස 09 වැනි දින.

11-60/6

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

මධ්‍යම පළාත නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988 පෙබරවාරි මස 08 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/4903 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගල්පාලම, නුවරඑළිය පදිංචි වයලට් ජයසිංහ මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/08/452/88 අංකය යටතේ 1988.04.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.02** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ 535 බී ජයලංකා ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පාලම නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය මැණුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එම්. 44/6 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පි. පි. නු. 541 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 12 2/2 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 25 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* :පි. පි. නු. 541 පිඹුරේ සඳහන් කැබලි අංක 12 1/2,
*නැගෙනහිරට* :පි. පි. නු. 541 පිඹුරේ සඳහන් කැබලි අංක 9 1/2,
*දකුණට* :පි. පි. නු. 541 පිඹුරේ සඳහන් කැබලි අංක 21,
*බස්නාහිරට* :පි. පි. නු. 541 පිඹුරේ සඳහන් කැබලි අංක 11

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2022 ජුනි මස 20 වැනි දින.

11-60/7

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/69908.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/ පීඑල්සී/ එල්03/ කැකි/4 (ii).

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 615, කැලෑ පුළියන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොස්සාගම හෙවත් නාවක්කුලම ගමේ 2021/කැකි/08 දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7.0519 ක් වාණිජ කටයුතු සඳහා ගලප්පත්තිගේ ප්‍රේමරත්න මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : රජයේ ඉඩම (අ.ග.පි. 1202 හි 63 කොටසක්),
*නැගෙනහිරට* : රජයේ ඉඩම (අ.ග.පි. 1202 හි 63 කොටසක්),
*දකුණට* : රජයේ ඉඩම (අ.ග.පි. 1202 හි 63 කොටසක්),
*බටහිරට* : රජයේ ඉඩම (අ.ග.පි. 1202 හි 63 කොටසක්),

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.10.05 දින සිට 2052.10.04 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- 2022.10.05 දින සිට ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.10.05 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-58

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/18643.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/ පීඑල්සී/ 2004/10/ 09/මැ. නි.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 628, තුලාන කැකිරාව ග්‍රාම නිලධාරි වසමේ කැකිරාව ගමේ ඉඩම් නිලධාරි විසින් සකසන ලද දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් පර්චස් 3.985 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා අබ්දුල් කාදර් ජෙයිලාබ්දීන් මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : සරීප් ලෙබ්බේ මොහොමඩ් මතීන්ගේ ඉඩම,
*නැගෙනහිරට* : දඹුල්ල කැකිරාව මහා මාර්ගය,
*දකුණට* : අසීස් නුරුල් හිදායා බීබිගේ ඉඩම,
*බටහිරට* : මුස්ලිම් පල්ලියට අයිති ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 1995.06.15 සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ මුදලින් 50% කට නොවැඩි විය යුතු ය.

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 1995.06.15 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහාවන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඉ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-59

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2022.12.02 | සිකුරාදා | 2022.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.09 | සිකුරාදා | 2022.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.16 | සිකුරාදා | 2022.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.23 | සිකුරාදා | 2022.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.30 | සිකුරාදා | 2022.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2023 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2023.01.05 | බ්‍රහස්පතින්දා | 2022.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.13 | සිකුරාදා | 2022.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.20 | සිකුරාදා | 2023.01.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.01.27 | සිකුරාදා | 2023.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.